# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## රාජ්‍ය වත්කම් කළමනාකරණ

**කොම්ප්ට්‍රෝලර් ජනරාල් දෙපාර්තමේන්තුව යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු සහ සඳහන් කරනු ලැබිය යුතු දෙපාර්තමේන්තුවක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද; රාජ්‍ය ආයතනයක් විසින් පූර්ණ හිමිකම දරනු ලබන, පවරන ලද, අත්කරගන්නා ලද, පවරා ගන්නා ලද, දරන ලද හෝ උපයෝජනය කරන ලද මූල්‍ය නොවන නිශ්චල හෝ චංචල වත්කම් හඳුනා ගැනීම සහ එම වත්කම්වල ජාතික වත්කම් ලේඛනයක් සම්පාදනය කිරීම සඳහා ද; එකී ලේඛනය කලින් කලට යාවත්කාලීන කිරීම සඳහා සහ එකී වත්කම්වල නිසි ප්‍රතිලාභ රාජ්‍ය ආයතන වෙත ලැබීම තහවුරු කිරීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි**

---

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා විසින්
2024 අගෝස්තු මස 21 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2024 අගෝස්තු මස 02 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[284 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 24.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# රාජ්‍ය වත්කම් කළමනාකරණ

එල්.ඞී-.ඕ. 43/2022

**කොම්ප්ට්‍රෝලර් ජනරාල් දෙපාර්තමේන්තුව යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු සහ සඳහන් කරනු ලැබිය යුතු දෙපාර්තමේන්තුවක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද; රාජ්‍ය ආයතනයක් විසින් පූර්ණ හිමිකම දරනු ලබන, පවරන ලද, අත්කරගන්නා ලද, පවරා ගන්නා ලද, දරන ලද හෝ උපයෝජනය කරන ලද මූල්‍ය නොවන නිශ්චල හෝ චංචල වත්කම් හඳුනා ගැනීම සහ එම වත්කම්වල ජාතික වත්කම් ලේඛනයක් සම්පාදනය කිරීම සඳහා ද; එකී ලේඛනය කලින් කලට යාවත්කාලීන කිරීම සඳහා සහ එකී වත්කම්වල නිසි ප්‍රතිලාභ රාජ්‍ය ආයතන වෙත ලැබීම තහවුරු කිරීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය

**1.** (1) මේ පනත 2024 අංක      දරන රාජ්‍ය වත්කම් කළමනාකරණ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) 8 වන වගන්තියේ (2) වන උපවගන්තිය හැර, මේ පනතේ විධිවිධාන, මේ පනත පාර්ලිමේන්තුවේ පනතක් ලෙස සහතික කරන ලද දිනයේ සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) 8 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, ජාතික වත්කම් ලේඛනයේ ක්‍රමික සම්පූර්ණ වීම සලකා අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

## I වන කොටස

## කොම්ප්ට්‍රෝලර් ජනරාල් දෙපාර්තමේන්තුව පිහිටුවීම

කොම්ප්ට්‍රෝලර් ජනරාල් දෙපාර්තමේන්තුව පිහිටුවීම

**2.** (මෙහි මින් මතු "දෙපාර්තමේන්තුව" යනුවෙන් සඳහන් කරනු ලබන) කොම්ප්ට්‍රෝලර් ජනරාල් දෙපාර්තමේන්තුව යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු දෙපාර්තමේන්තුවක් පිහිටුවනු ලැබිය යුතු ය.

**කොම්ප්ට්‍රෝලර් ජනරාල්වරයා සහ අනෙකුත් නිලධරයන් සහ සේවා නියුක්තයන්**

**3.** (1) (මෙහි මින් මතු "කොම්ප්ට්‍රෝලර් ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා විය යුතු කොම්ප්ට්‍රෝලර් ජනරාල්වරයකු සහ දෙපාර්තමේන්තුවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය සිදු කරගෙන යාමට කලින් කලට, අවශ්‍ය කරනු ලැබිය හැකි පරිදි අනෙකුත් නිලධරයන් සහ සේවානියුක්තයන් පත් කරගනු ලැබිය යුතු ය.

(2) රාජ්‍ය ආයතනයක මූල්‍ය නොවන වත්කම් සම්බන්ධයෙන් කලින් කලට අවශ්‍ය යයි සලකනු ලබන පරිදි, කොම්ප්ට්‍රෝලර් ජනරාල්වරයා විසින්, ඔහුගේ යම් බලතලයක්, කාර්යයක් සහ කර්තව්‍යයක් ලිඛිතව අදාළ රාජ්‍ය ආයතනයේ ප්‍රධානියා වෙත පවරනු ලැබිය හැකි ය.

**දෙපාර්තමේන්තුවේ අරමුණු**

**4.** දෙපාර්තමේන්තුවේ අරමුණු පහත දැක්වෙන පරිදි විය යුතු ය:-

(අ) මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීම සඳහා යාවත්කාලීන වූ සහ සවිස්තරාත්මක මධ්‍යගත දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීම සහ ඒ අනුව මූල්‍ය නොවන වත්කම්වලට අදාළ විස්තර ඇතුළත් ජාතික වත්කම් ලේඛනයක් ස්ථාපිත කිරීම;

(ආ) කලින් කලට, රජය මගින් නියම කරනු ලබන ප්‍රතිපත්ති, මාර්ගෝපදේශ සහ කාර්යපටිපාටිවලට අනුකූලව, රාජ්‍ය ආයතන මගින් මූල්‍ය නොවන වත්කම් උපයෝජනය සහ කළමනාකරණය සිදු කරනු ලබන බවට තහවුරු කිරීම;

(ඇ) රජයේ සංවර්ධන රාමුව ශක්තිමත් කිරීම සඳහා මූල්‍ය නොවන වත්කම් ඵලදායී සහ කාර්යක්ෂම ලෙස භාවිත කිරීම සඳහා මඟ පෙන්වීම; සහ

(ඈ) රාජ්‍ය ආයතනවල මූල්‍ය නොවන වත්කම් අපහරණය කරනු ලබන අවස්ථාවක දී, එකී රාජ්‍ය ආයතන විසින් ආදායම් එකතු කිරීම තහවුරු කිරීම.

**දෙපාර්තමේන්තුවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය**

**5.** දෙපාර්තමේන්තුවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය පහත සඳහන් පරිදි විය යුතු ය:-

(අ) රජය විසින් නියම කරනු ලබන අදාළ ප්‍රතිපත්ති, මාර්ගෝපදේශ සහ කාර්යපටිපාටිවලට අනුකූලව, මේ

පනතේ 6 වන වගන්තිය යටතේ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් මූල්‍ය නොවන වත්කම් හඳුනා ගැනීම සහ වර්ගීකරණය කිරීම;

(ආ) රාජ්‍ය ආයතනවලින් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ විස්තර ලබා ගැනීම;

(ඇ) මේ පනතේ 6 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් කලින් කලට, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන සහ නිවේදනයක් මගින් හඳුනාගනු ලබන මූල්‍ය නොවන වත්කම්වලට අදාළ තොරතුරු වාර්තා කිරීමට සවිස්තරාත්මක මධ්‍යගත දත්ත පද්ධතියක් ඇති කිරීම සහ පවත්වාගෙන යාම;

(ඈ) කොම්ප්ට්‍රෝලර් ජනරාල්වරයා විසින් තත්කාර්ය සඳහා සාදන ලද රීති මගින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි මධ්‍යගත දත්ත පද්ධතිය කලින් කලට යාවත්කාලීන කිරීම;

(ඉ) මේ වගන්තියේ (ඇ) සහ (ඈ) ඡේදවල සඳහන් කරන ලද මධ්‍යගත දත්ත පද්ධතියේ තොරතුරු මත පදනම්ව ජාතික වත්කම් ලේඛනයක් සම්පාදනය කිරීම සහ කොම්ප්ට්‍රෝලර් ජනරාල්වරයා විසින් තත්කාර්ය සඳහා සාදන ලද රීති මගින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි එකී ලේඛනය කලින් කලට යාවත්කාලීන කිරීම;

(ඊ) 7 වන, 12 වන සහ 13 වන වගන්තිවල දක්වා ඇති කරුණුවලට බලාත්මකභාවයක් ලබා දීමේ දී අවශ්‍ය පියවර ගැනීම සහ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය කිරීම සඳහා රාජ්‍ය ආයතනවලට තොරතුරු සැපයීම;

(උ) මේ පනතේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති ආකාරයෙන් මූල්‍ය නොවන වත්කම්වල තක්සේරුව තහවුරු කිරීම සඳහා 7 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලබන මාර්ගෝපදේශ සහ විධාන සකස් කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ඌ) රාජ්‍ය ආයතනයක් විසින් මූල්‍ය නොවන වත්කම් බදු හෝ කුලී පදනම මත වෙනත් පාර්ශ්වයකට මුදා හරිනු ලබන අවස්ථාවක දී, රජයේ අපහරණ ක්‍රමවේදය තුළින්

හෝ අමාත්‍ය මණ්ඩලය විසින් නියම කරනු ලැබිය හැකි අදාළ කාර්යපටිපාටියකට අනුව අපහරණය කරනු ලබන අවස්ථාවක දී, එකී මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීම සඳහා සහ අදාළ ආදායම් එකතු කිරීම හා වාර්තා කිරීම සම්බන්ධයෙන් අදාළ කරගත යුතු 7 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලැබිය යුතු මාර්ගෝපදේශ සහ විධාන සකස් කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම;

(එ) මූල්‍ය නොවන වත්කම් නීති විරෝධී ආකාරයකින් වෙනත් පාර්ශ්ව විසින් අත්කර ගෙන ඇති බවට හෝ භාවිත කරන බවට තොරතුරු ලැබී ඇති අවස්ථාවක දී, එකී වත්කම් ආපසු ලබා ගැනීමේ ක්‍රියාවලියේ දී අදාළ රාජ්‍ය ආයතන සමග සම්බන්ධීකරණය කිරීම;

(ඒ) මූල්‍ය නොවන වත්කම් නිසි පරිදි උපයෝජනය කර නොමැති බවට පෙනී යන අවස්ථාවල දී, අදාළ රාජ්‍ය ආයතන සමග සම්බන්ධීකරණය කිරීම සහ එකී වත්කම් සංවර්ධන කටයුතු සඳහා ඵලදායී ලෙස භාවිත කිරීමට යොදා ගත හැකි සුදුසු ක්‍රියාමාර්ග යෝජනා කරමින් එසේ කළ හැකි වෙනත් රාජ්‍ය ආයතන හඳුනා ගැනීම;

(ඔ) මේ පනත යටතේ දෙපාර්තමේන්තුවේ කාර්ය ඉටු කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය නොවන වත්කම්වලට අදාළ සිතියම්, මිනින්දෝරු සැලසුම් හෝ වෙනත් යම් ලේඛනවල පිටපත් ඒවායේ භෞතික ස්වරූපය හෝ ස්වභාවය නොසලකා අදාළ රාජ්‍ය ආයතනවලින් ලබා ගැනීම; සහ

(ඕ) මේ පනතේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි පරිදි ආදායම් ගණන් දීමේ නිලධරයකු වශයෙන් ක්‍රියා කිරීම.

අමාත්‍යවරයා විසින් වත්කම් හඳුනා ගැනීම සහ වර්ගීකරණය සිදු කළ යුතු බව

**6.** භාණ්ඩාගාර ලේකම්වරයාගේ නිර්දේශ මත පදනම්ව අමාත්‍යවරයා විසින්, කලින් කලට, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් අදාළ විස්තර සහිතව මූල්‍ය නොවන වත්කම් හඳුනා ගැනීම සහ වර්ගීකරණය කිරීම කළ හැකි ය. එකී නිර්දේශ කොම්ප්ට්‍රෝලර් ජනරාල්වරයා විමසා සිදු කළ යුතු ය.

*භාණ්ඩාගාර ලේකම්වරයා විසින් නිර්දේශ ඉදිරිපත් කිරීම සහ විධාන සහ මාර්ගෝපදේශ නිකුත් කිරීම සිදු කළ යුතු බව*

**7.** මේ පනතේ පරමාර්ථ ඉෂ්ට කර ගැනීමේ කාර්යය සඳහා භාණ්ඩාගාර ලේකම්වරයා විසින් කොම්ප්ට්‍රෝලර් ජනරාල්වරයා විමසා -

(අ) අමාත්‍ය මණ්ඩලය විසින් සකස් කළ යුතු ප්‍රතිපත්ති සම්බන්ධයෙන් අමාත්‍යවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම; සහ

(ආ) විධාන හා මාර්ගෝපදේශ නිකුත් කිරීම,

සිදු කළ හැකි ය.

## II වන කොටස

## ජාතික වත්කම් ලේඛනය

*ජාතික වත්කම් ලේඛනය පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු බව*

**8.** (1) දෙපාර්තමේන්තුව විසින්, මූල්‍ය නොවන වත්කම්වල මූල්‍යමය වටිනාකම ඇතුළුව මූල්‍ය නොවන වත්කම්වල අදාළ විස්තර පිළිබිඹු කිරීම සඳහා සියලුම රාජ්‍ය ආයතන සම්බන්ධයෙන් ජාතික වත්කම් ලේඛනය සකස් කළ යුතු ය.

(2) ජාතික වත්කම් ලේඛනය වාර්ෂිකව යාවත්කාලීන කරනු ලැබිය යුතු අතර, පූර්ව මුදල් වර්ෂයට අදාළ එකී ලේඛනයේ සාරාංශයක්, ඉක්බිති වර්ෂයේ ජූනි මස තිස් වන දින හෝ ඊට පෙර, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.

*අමාත්‍ය මණ්ඩලය වෙත වාර්තා කිරීම*

**9.** දෙපාර්තමේන්තුව විසින්, අවශ්‍ය වූ විටෙක, මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය කිරීම සඳහා අදාළ තොරතුරු ද සමඟ අමාත්‍ය මණ්ඩලය වෙත වාර්තා කරනු ලැබිය යුතු ය.

*රාජ්‍ය ආයතනවල නිලධරයන් විසින් තොරතුරු සැපයිය යුතු බව*

**10.** (1) දෙපාර්තමේන්තුව විසින් අවස්ථාවෝචිත පරිදි, යම් රාජ්‍ය ආයතනයක ප්‍රධාන ගණන් දීමේ නිලධරයාට, ගණන් දීමේ නිලධරයාට, සභාපතිවරයාට හෝ ප්‍රධාන විධායක නිලධරයාට ලිඛිතව යවනු ලබන ඉල්ලීමක නිශ්චිතව සඳහන් කාලයක් තුළ එකී රාජ්‍ය ආයතනයේ මූල්‍ය නොවන වත්කම්වලට අදාළ යම් තොරතුරක්, ලේඛනයක්, පැහැදිලි කිරීමක්, වාර්තාවක් හෝ වැදගත් යමක්, දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිය හැකි ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ දෙපාර්තමේන්තුව විසින් එකී තොරතුරක් හෝ වෙනත් කරුණක් ඉල්ලා සිටිනු ලබන

අවස්ථාවක දී, දෙපාර්තමේන්තුව ඉල්ලා සිටිනු ලබන එකී තොරතුර හෝ වෙනත් කරුණ ඉදිරිපත් කිරීම අවස්ථාවෝචිත පරිදි එකී ප්‍රධාන ගණන් දීමේ නිලධරයාගේ, ගණන් දීමේ නිලධරයාගේ, සභාපතිවරයාගේ හෝ ප්‍රධාන විධායක නිලධරයාගේ කාර්යය විය යුතු ය.

(3) මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වන ඉල්ලීමක නිශ්චිතව දක්වා ඇති කාලසීමාව තුළ තොරතුරක් හෝ වෙනත් කරුණක් සැපයීම ප්‍රායෝගිකව අපහසු වන අවස්ථාවක දී හෝ එකී තොරතුර සැපයීමට අතිරේක කාලයක් අවශ්‍ය වන අවස්ථාවක දී, දෙපාර්තමේන්තුව වහා දැනුවත් කළ යුතු අතර, වැඩ කරන දින විසිඑකකට නොවැඩි තවදුරටත් වූ කාලයක් ලබාගත හැකි ය.

(4) මේ වගන්තියේ (3) වන උපවගන්තියේ නියම කරනු ලැබ ඇති කාලසීමාව තුළ එකී තොරතුර, ලේඛනය, පැහැදිලි කිරීම, වාර්තාව හෝ වැදගත් කරුණ අවස්ථාවෝචිත පරිදි, ඉදිරිපත් කිරීමට අපොහොසත් වන හෝ ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කරන ප්‍රධාන ගණන් දීමේ නිලධරයකු, ගණන් දීමේ නිලධරයකු, සභාපතිවරයකු හෝ ප්‍රධාන විධායක නිලධරයකු එකී කාලසීමාව ඉකුත් වී සති දෙකක් ඇතුළත කොම්ප්ට්‍රෝලර් ජනරාල්වරයා වෙත පැහැදිලි කිරීමක් ඉදිරිපත් කිරීමට බැඳී සිටිය යුතු ය. ඉදිරිපත් කරන ලද, එකී පැහැදිලි කිරීම, භාණ්ඩාගාර ලේකම්වරයා විසින් පත් කරනු ලබන, නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම්වරයකු, දෙපාර්තමේන්තුවේ නියෝජිතයකු සහ එකී ප්‍රධාන ගණන් දීමේ නිලධරයා, ගණන් දීමේ නිලධරයා, සභාපතිවරයා හෝ ප්‍රධාන විධායක නිලධරයා අයත් වන රේඛීය අමාත්‍යාංශය නොවන අමාත්‍යාංශයක නියෝජිතයකු ඇතුළත් සාමාජිකයන් තිදෙනකුගෙන් සමන්විත අභියාචන කමිටුවක් විසින් සලකා බැලිය යුතු අතර, අභියාචනා කමිටුව විසින් එකී පැහැදිලි කිරීම භාර ගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම සිදු කළ හැකි ය.

(5) මේ වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ අවස්ථාවෝචිත පරිදි, පැහැදිලි කිරීම ඉදිරිපත් කිරීමට අපොහොසත් වන හෝ ප්‍රතික්ෂේප කරනු ලබන හෝ තමා විසින් ඉදිරිපත් කරන ලද පැහැදිලි කිරීම මේ වගන්තියේ (4) වන උපවගන්තියේ සඳහන් කරන ලද අභියාචනා කමිටුව විසින් ප්‍රතික්ෂේප කරනු ලබන ප්‍රධාන ගණන් දීමේ නිලධරයා, ගණන් දීමේ නිලධරයා, සභාපතිවරයා හෝ ප්‍රධාන විධායක නිලධරයා විසින් වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට වරදකරු කරනු ලැබීමෙන් අනතුරුව, එකී නිලධරයා විසින් පෞද්ගලිකව ම ගෙවනු ලැබිය යුතු රුපියල් දසදහසකට නොඅඩු සහ රුපියල් ලක්ෂයකට නොවැඩි දඩ මුදලකට යටත් විය යුතු ය.

III වන කොටස

**සාමාන්‍ය**

නඩු කටයුතුවලින් ආරක්ෂාව

**11.** භාණ්ඩාගාර ලේකම්වරයා, භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරයා, කොම්ප්ට්‍රෝලර් ජනරාල්වරයා හෝ දෙපාර්තමේන්තුවේ සේවානියුක්තයකු, අභියාචනා කමිටුවේ සාමාජිකයකු හෝ ඊට පෙර එකී යම් තනතුරක් දරනු ලැබූ තැනැත්තකු විසින් මේ පනතේ විධිවිධාන යටතේ වන බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී සහ කිරීමේ දී සද්භාවයෙන් සිදු කරනු ලබන හෝ සිදු කරන ලද බව ගම්‍ය වන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන්, තමන් විසින් සද්භාවයෙන් කටයුතු කරනු ලැබූ බව සහ තමන් විසින් සියලු නිසි උද්‍යෝගයෙන්, සාධාරණ සැලකිල්ල හා කුසලතාවයෙන් කටයුතු කළ බව ඒ තැනැත්තා ඔප්පු කරන්නේ නම්, ඒ තැනැත්තාට එරෙහිව කිසිදු සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

නියෝග

**12.** (1) අමාත්‍යවරයා විසින්, භාණ්ඩාගාර ලේකම්වරයාගේ නිර්දේශ මත, මේ පනත මගින් නියම කරනු ලැබිය යුතු යයි නියමිත කාරණා සම්බන්ධයෙන් හෝ දෙපාර්තමේන්තුවේ අරමුණු සහ මේ පනතේ විධිවිධාන බලාත්මක කිරීම සඳහා නියෝග සෑදීම අවශ්‍ය වන්නා වූ කරුණු සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය. එම නිර්දේශ කොම්ප්ට්‍රෝලර් ජනරාල්වරයා විමසා සිදු කළ යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලබන දිනයෙහි හෝ නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි වෙනත් යම් පසු දිනයක දී හෝ ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම එය ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු හැකි පහසු ඉක්මනින් අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නොලබන යම් නියෝගයක් ඒ යටතේ කලින් සිදු කරන ලද කිසිවකට අගතියක් නොමැතිව එම අනනුමතය ලැබූ දිනයේ සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) යම් නියෝගයක් පරිච්ඡින්න කරන ලද බවට සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

රීති

**13.** (1) කොම්ප්ට්‍රෝලර් ජනරාල්වරයා විසින් භාණ්ඩාගාර ලේකම්වරයාගේ නිර්දේශ සහිතව මේ පනතේ විධිවිධාන, පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් රීති සෑදිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම රීතියක් ම අමාත්‍යවරයා විසින් අනුමත කළ යුතු ය.

(3) එලෙස අනුමත කරන ලද සෑම රීතියක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කිරීමෙන් අනතුරුව බලාත්මක විය යුතු ය.

මේ පනතේ උපලේඛනය සංශෝධනය කිරීම

**14.** (1) මේ පනතේ උපලේඛනය, අමාත්‍යවරයා විසින් සාදා ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයක් මගින් සංශෝධනය කිරීම හෝ වෙනස් කිරීම කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තිය යටතේ සාදන ලද සෑම නියමයක් ම එකී පළ කිරීමේ දිනයේ දී හෝ එකී නියමයේ නිශ්චිතව දක්වා ඇති වෙනත් පසු දිනක දී බලාත්මක විය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ සාදනු ලබන සෑම නියමයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, හැකි පහසු ඉක්මනින් අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.

(4) පාර්ලිමේන්තුව මගින් අනුමත කිරීම ප්‍රතික්ෂේප කරන ලද සෑම නියමයක් ම, එසේ ප්‍රතික්ෂේප කිරීමේ දිනයේ සිට ප්‍රත්‍යාදිෂ්ට කරන ලද බවට සැලකිය යුතු නමුත්, පෙර ඒ යටතේ සිදු කරන ලද යමකට ඉන් අගතියක් සිදු නොවිය යුතු ය.

ඉතිරි කිරීම්

**15.** (1) 2017 පෙබරවාරි මස 21 වන දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව පිහිටුවන ලද සහ වර්තමානයේ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයට අනුයුක්තව ඇති (මෙහි මින් මතු "කාර්යාලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය, මේ පනත ආරම්භ කරනු ලබන දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි මේ පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවන ලද දෙපාර්තමේන්තුවට මාරු කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී කාර්යාලයේ සේවයේ නියුතු කොම්ප්ට්‍රෝලර් ජනරාල්වරයා, සියලුම නිලධරයන් සහ සේවානියුක්තයන්, මේ පනත ආරම්භ කරනු ලබන

දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි, මේ පනත යටතේ පිහිටුවන ලද දෙපාර්තමේන්තුවේ නිසි ලෙස පත් කරන ලද කොම්ප්ට්‍රෝලර් ජනරාල්වරයා නිලධරයන් සහ සේවානියුක්තයින් ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) කාර්යාලය මගින් කරනු ලැබූ සියලුම කාර්යයන් මේ පනත ආරම්භ කළ දිනයේ සිට මේ පනත යටතේ කරගෙන යනු ලැබුවා සේ සැලකිය යුතු අතර, මේ පනත යටතේ අඛණ්ඩව කරගෙන යනු ලැබිය යුතු ය.

(4) මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ කාර්යාලය විසින්, කාර්යාලය සමඟ හෝ කාර්යාලය සඳහා දරන ලද ණය, බැඳීම්, වත්කම් සහ වගකීම්, එළඹෙන ලද ගිවිසුම් සහ එකඟතා සහ නිරත වනු ලබන හෝ සිදු කිරීමට එකඟතාවය පළ කරන ලද සියලුම කාරණා මේ පනත ආරම්භ වන දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි මේ පනත යටතේ පිහිටුවන ලද දෙපාර්තමේන්තුව විසින්, දෙපාර්තමේන්තුව සමඟ හෝ දෙපාර්තමේන්තුව සඳහා දරන ලද ණය, බැඳීම්, වත්කම් සහ වගකීම්, එළඹෙන ලද ගිවිසුම් සහ එකඟතා සහ නිරත වනු ලබන හෝ සිදු කිරීමට එකඟතාවය පළ කරන ලද කාරණා වශයෙන් සලකනු ලැබිය යුතු ය.

(5) මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයෙහි කාර්යාලය සතුව පැවති සියලු නිශ්චල සහ චංචල දේපළ, මේ පනත ආරම්භ කරනු ලබන දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි මේ පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවන ලද දෙපාර්තමේන්තුව වෙත පවරනු ලැබිය යුතු ය.

(6) කාර්යාලය සම්බන්ධයෙන් සාදන ලද සහ මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ සිට බලාත්මකව පවතින්නා වූ ද, මේ පනතේ විධිවිධාන හා අනනුකූල නොවන්නා වූ ද සියලු නියෝග, රීති, මාර්ගෝපදේශ හා විධාන, මේ පනත ආරම්භ කරනු ලබන දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි, මේ පනත යටතේ සාදන ලද නියෝග, රීති, මාර්ගෝපදේශ හා විධාන ලෙස සලකනු ලැබිය යුතු අතර, මේ පනත යටතේ සාදන ලද නියෝග, රීති, මාර්ගෝපදේශ හා විධාන මගින් සංශෝධනය කිරීම, එකතු කිරීම සහ අහෝසි කිරීම සිදු කරනු ලැබිය හැකි ය.

(7) කාර්යාලය විසින් හෝ ඊට එරෙහිව පවරනු ලැබ ඇත්තා වූ ද සහ මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ

දිනයේ දී අවසන් නොවී පවතින්නා වූ ද සියලු නඩු කටයුතු, පැමිණිලි, නඩුකර හෝ නීති කෘත්‍ය මේ පනත ආරම්භ වන දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි, මේ පනත යටතේ පිහිටුවන ලද දෙපාර්තමේන්තුව විසින් හෝ ඊට එරෙහිව පවරන නඩු කටයුතු, පැමිණිලි, නඩුකර හෝ නීති කෘත්‍ය ලෙස සලකනු ලැබිය යුතු අතර, එය අඛණ්ඩව ක්‍රියාත්මක විය යුතු ය.

(8) යම් නඩුවක දී හෝ නඩු කටයුත්තක දී කාර්යාලයට පක්ෂව හෝ ඊට එරෙහිව යම් අධිකරණයක්, විනිශ්චය සභාවක් හෝ වෙනත් අධිකාරයක් විසින් එළඹෙන ලද සියලු තීන්දු ප්‍රකාශ, ආඥා හෝ ප්‍රදාන මේ පනත ආරම්භ කරන ලද දිනයේ සිට දෙපාර්තමේන්තුවට පක්ෂව හෝ එයට එරෙහිව එළඹෙන ලද තීන්දු ප්‍රකාශ, ආඥා හෝ ප්‍රදාන ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ක්‍රියාත්මක කළ යුතු ය.

අර්ථ නිරූපණය

**16.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස -

"ගණන් දීමේ නිලධරයා" යන්නෙන්, භාණ්ඩාගාරය මඟින් වෙනත් වැඩපිළිවෙළ පිළියෙල කර ඇති අවස්ථාවක දී හැර, මූල්‍ය රෙගුලාසිවල 125(1) හි සඳහන් කරනු ලබන, දෙපාර්තමේන්තුවක සියලුම මූල්‍ය ගනුදෙනු සම්බන්ධයෙන් වන එකී දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා අදහස් වේ;

වෙනත් යම් ලිඛිත නීතියක නිශ්චිතව සපයා ඇති අවස්ථාවක මිස, "ප්‍රධාන ගණන් දීමේ නිලධරයා" යන්නට-

(අ) අමාත්‍යාංශයක ප්‍රධාන ගණන් දීමේ නිලධරයා වශයෙන් පත් කරන ලද එකී අමාත්‍යාංශයේ ලේකම්වරයා;

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 52 (7) වන ව්‍යවස්ථාවේ සඳහන් කරනු ලැබ ඇති රජයේ දෙපාර්තමේන්තුවක් භාර නිලධරයකු; හෝ

(ඇ) (අ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති පරිදි ලේකම්වරයකු විසින්

අධීක්ෂණය කරනු නොලබන වෙනත් යම් දෙපාර්තමේන්තුවක් හෝ අස්තිත්වයක් භාර නිලධරයකු,

ඇතුළත් වේ;

"රාජ්‍ය ආදායම" යන්නට, මූල්‍ය නොවන වත්කම් අපහරණය කිරීමෙන් ලැබෙන ආදායම ඇතුළත් වේ;

"පළාත් පාලන ආයතන" යන්නෙන්, යම් මහ නගර සභාවක්, නගර සභාවක්, ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, එකී යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරනු ලබන, කරනු ලබන සහ ඉටු කරනු ලබන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වූ බලතල, කාර්ය සහ කර්තව්‍යය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ කිරීම සඳහා යම් නීතියක් මගින් හෝ නීතියක් යටතේ නිර්මාණය කරන ලද හෝ පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරයක් ඊට ඇතුළත් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන සහ 45 වන ව්‍යවස්ථාව යටතේ මුදල් විෂයය පැවරී ඇති අමාත්‍යවරයා අදහස් වේ;

"මූල්‍ය නොවන වත්කම්" යන්නට, ඉඩම්, ගොඩනැගිලි, ඉදිකිරීම්, පිරියත සහ යන්ත්‍රෝපකරණ, වාහන, කාර්යාලයීය උපකරණ හා ගෘහ භාණ්ඩ වශයෙන් වර්ගීකරණය කරන ලද හෝ මේ පනතේ 6 වන වගන්තිය යටතේ පළ කරන ලද නිවේදනයක් මගින් මූල්‍ය නොවන වත්කම් වශයෙන් ප්‍රකාශයට පත් කරන ලද; සහ රාජ්‍ය ආයතනයක් විසින් පූර්ණ වශයෙන් හිමිකම දරනු ලබන, පවරන ලද, අත්කර ගන්නා ලද, පවරා ගන්නා ලද, දරනු ලබන, උපයෝජනය කරනු ලබන, කල්බදු පදනම මත ලබා ගන්නා ලද, කුලී පදනම මත ලබා ගන්නා ලද හෝ කල්බදු පදනම මත හෝ කුලී පදනම මත

වෙනත් පාර්ශ්වයකට මුදා හරින ලද හෝ රජයේ කාර්යපටිපාටි හෝ අමාත්‍ය මණ්ඩලය විසින් නියම කරන ලද අදාළ කාර්යපටිපාටි හරහා අපහරණය කරනු ලබන යම් නිෂ්පාදිත හෝ නිෂ්පාදනය නොකරන ලද මූල්‍ය නොවන චංචල හෝ නිශ්චල වත්කම් ඇතුළත් වේ;

"පළාත් සභාවක්" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIIඅ පරිච්ඡේදය ප්‍රකාරව පිහිටුවන ලද පළාත් සභාවක් අදහස් වේ;

"රාජ්‍ය සංස්ථාවක්" යන්නෙන්, 2007 අංක 07 දරන සමාගම් පනත හැර, වෙනත් යම් ලිඛිත නිතීයක් හෝ ලිඛිත නීතියක් යටතේ පිහිටුවනු ලැබූවා වූ හෝ ලබන්නා වූ ද, ආණ්ඩුව විසින් ණයක්, ප්‍රදානයක් නැතහොත් වෙනත් ආකාරයකින් මුළු ප්‍රාග්ධනය හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලබන්නා වූ ද සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ;

"රාජ්‍ය ආයතන" යන්නට, විශේෂ වියදම් ඒකක, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, පළාත් සභා, පළාත් පාලන ආයතන, රාජ්‍ය සංස්ථා, යම් ලිඛිත නීතියක් යටතේ රජයට පැවරී ඇති ව්‍යාපාර හෝ වෙනත් භාරගත් කටයුතු සහ රජය, රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් විසින් සියයට පනහකට වැඩි කොටස් ප්‍රමාණයක් දරනු ලබන, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කරනු ලැබ ඇති සමාගම් ඇතුළත් වේ;

"ආදායම් ගණන් දීමේ නිලධරයා" යන්නෙන්, භාණ්ඩාගාරය විසින්, කලින් කලට, නම් කරනු ලබන, 125 (2) වන මුදල් රෙගුලාසිවල සඳහන් කරනු ලබන ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම සඳහා වගකිව යුතු නිලධරයා අදහස් වේ;

"විශේෂ වියදම් ඒකක" යන්නෙන්, අදාළ විසර්ජන පනතේ වැය ශීර්ෂයක් ලබා දී ඇති අමාත්‍යාංශයක්, දෙපාර්තමේන්තුවක්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයක් හෝ පළාත් සභාවක් හැර, යම් අස්තිත්වයක් අදහස් වේ.

**17.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

උපලේඛනය

(5 වන වගන්තිය)

| අංකය | මූල්‍ය නොවන වත්කම් වර්ගය | එකී වත්කම් තක්සේරුව සිදු විය යුතු කාලසංඛ්‍යානය |
|---|---|---|
| 1 | ඉඩම් | වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දින වසර පහකට එක් වරක්. කෙසේ වුව ද, වත්කම්වල වටිනාකමට සැලකිය යුතු වෙනසක් ඇති කරනු ලබන යම් සිදුවීමක් වේ නම්, අදාළ වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනට එකී වත්කම්වල වටිනාකම තක්සේරු කළ යුතු ය. වටිනාකමේ සැලකිය යුතු වෙනසක් සිදු වූ වත්කමේ නැවත තක්සේරුව, ප්‍රායෝගික වශයෙන් ඵලදායී වීම සඳහා, නව තක්සේරු වර්ෂයේ හෝ නව තක්සේරුවට පෙරාතුව ම වූ සමීපතම තක්සේරු වර්ෂයේ සිට වසර පහක් සම්පූර්ණ වනු ලබන වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනට සිදු කළ හැකි ය. |
| 2 | ගොඩනැගිලි | |
| 3 | ඉදිකිරීම් | |
| 4 | පිරියත සහ යන්ත්‍රෝපකරණ | |
| 5 | වාහන | |
| 6 | කාර්යාලයීය උපකරණ සහ ගෘහ භාණ්ඩ | |